# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2022.01.12 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2022/01**

**සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන්,**
**පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු කටයුතු ප්‍රවර්ධනය සහ One Stop Shop වැඩසටහන පිළිබඳ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීම. - 2022</u>**

## 1. හැඳින්වීම.

සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුළු ප්‍රජාමූල සංවිධාන සාමාජිකයන්ගේ ජීවනෝපාය සංවර්ධනය ඇති කරමින් තිරසාර වූ ජීවන තත්ත්වයන් ලගා කරදීමට අවශ්‍ය වන්නා වූ ණය පහසුකම් ඇතුළු අනෙකුත් මූල්‍ය යටිතල පහසුකම් සලසා දෙන කේන්ද්‍රස්ථානය සමෘද්ධි බැංකුව බවට පත්කිරීමට 2022 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් වූ රජයේ අය වැය ලේඛනයේ **One Stop Shop** සංකල්පය හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, සමෘද්ධි බැංකු ජාලය හරහා ඉතුරුම් රැස් කිරීම හා ක්ෂුද්‍ර ණය පහසුකම් ලබාදීම ඇතුළු බොහෝ මූල්‍ය සේවාවන් ඉලක්කගත ප්‍රජාවට ලබාදීම තවදුරටත් පුළුල් කර වේගවත් සහ කඩිනමින් සිදුකිරීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත.

ඒ අනුව, ගරු මුදල් අමාත්‍යතුමන්ගේ සංකල්පය මත **One Stop Shop** වැඩසටහන සමෘද්ධි බැංකු වෙත හඳුන්වාදීමත්, සමෘද්ධි බැංකු මගින් ලබාදෙන ණය පහසුකම් පිළිබඳ දැනුවත් කර, එම කටයුතු පිළිබඳ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන දියත් කිරීමට සැලැසුම් කර ඇත.

ඒ පිළිබඳ 2022.01.11 වන දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඔබ ඇතුළු දිස්ත්‍රික් බැංකු විෂය, අධීක්ෂණ කළමනාකරුවන් දැනුවත් කල පරිදි, සමෘද්ධි බැංකු සහ ප්‍රජාමූල සංවිධාන හරහා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මෙමගින් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

## 2. දිස්ත්‍රික් මට්ටමින් මූලික දැනුවත් කිරීමේ වැඩසටහන්,

i. වැඩසටහන පැවැත්විය යුතු කාල සීමාව. - 2022 ජනවාරි 18 -25 අතර දිනයක
ii. කැඳවිය යුතු පිරිස
- සමෘද්ධි බැංකු කළමනාකරුවන්
- සමෘද්ධි බැංකු සමිති කළමනාකරුවන්
- දිස්ත්‍රික් බැංකු අධීක්ෂණ ඒකකයේ නිළධාරීන්
- දිස්ත්‍රික් විගණන අංශයේ කළමනාකරුවෙක්

iii. දැනුවත් කල යුතු කරුණු සහ පුහුණුකරුවන් තෝරා ගැනීම.

- 2022.01.11 වන දින සිදුකරන ලද දැනුවත් කිරීම් සහ ලබාදුන් පත්‍රිකාවන් අනුව දැනුවත් කිරීම සිදුකල යුතුය.
- සමෘද්ධි බැංකු මට්ටමින් දැනුවත් කිරීම සඳහා වැඩසටහන පිළිබඳව දැනුමක් සහ සංනිවේදන කුසලතා සහිත නිළධාරීන් කණ්ඩායමක් හඳුනාගැනීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා කාල රාමුවක් සකස් කරගැනීම.

## 03. වැඩමුළුව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් ලබාගැනීම.

ඔබ දිස්ත්‍රික්කයේ පැවැත්වීමට යෝජිත දැනුවක් කිරීමේ වැඩසටහනට සහභාගිවන නිළධාරීන් සඳහා දිවා ආහාරය සහ සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන, වැය ඇස්තමේන්තුවක් සකස් කර ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතුය.

## 04. සමෘද්ධි බැංකු මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන.

i. සහභාගි කර ගත යුතු පිරිස

- ග්‍රාම නිළධාරී වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරීන්.
- පාලක මණ්ඩල සභාපති සහ සාමාජිකයන්.
- ප්‍රජාමූල සංවිධාන නිළධාරීන්. (සභාපති, ලේකම්, උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික)

ii. වැඩසටහන පැවත්විය යුතු කාල සීමාව. - 2022 .02.01 සිට 2022.02.28 අතර දිනයක.

iii. දැනුවත් කලයුතු කරුණු

- ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් ලබාදුන් උපදෙස් සහ දැනුවත් කිරීම් අනුව දිස්ත්‍රික් දැනුවත් කිරීම් කමිටු නිළධාරියෙකු සහභාගි කරගෙන දැනුවත් කිරීම ඉහත සඳහන් නිළධාරීන්ට ලබාදීම සිදුකල යුතුය.

iv. මෙම දැනුවත් කිරීම පැය 02 කට සීමා කලයුතු අතර, දැනුවත් කිරීමට සහභාගි වන සම්පත්දායක නිළධාරියා හට සම්පත්දායක දීමනාවක් (පැය 01 X 600= 1200) ක් ලබාදීමට කටයුතු කල යුතුය. සම්පත්දායකයන් දෙදෙනෙකු සහභාගි වන විටක එක් අයෙකුට පැය 01 ක් සඳහා දීමනාව ලබාදිය යුතුය. තේ පැන් සංග්‍රහයක් ලබා දිය යුතුය. දරනු ලබන වියදම පාලක මණ්ඩල අනුමැතිය/ ආවරණ අනුමැතිය මත සිදුකල යුතු ය.

v. මෙම කාර්යය සමෘද්ධි බැංකු කළමනාකරු විසින් සිදුකල යුතු අතර, සම්පත්දායකයන් කැඳවා ගැනීම, දැනුවත් කිරීම සංවිධානය කිරීම, සංග්‍රහයක් පිළියෙල කිරීම බැංකු කළමනාකරුගේ වගකීමක් වේ.

vi. මෙම කාර්යය බැංකු සමිති කළමනාකරු විසින් අධීක්ෂණය කල යුතුය.

## 05. ප්‍රජාමූල සංවිධාන මට්ටමින් සාමාජිකයන් දැනුවත් කිරීම.

සමෘද්ධි බැංකු මට්ටමින් ලබාදුන් දැනුවත් කිරීම් සහ උපදෙස් මත ග්‍රාම නිළධාරී වසමභාර සමෘද්ධි සංවර්ධන නිළධාරී ඇතුළු ප්‍රජාමූල සංවිධානවල නිළධාරීන් විසින් සිදු කල යුතුය.

මෙම දැනුවත් කිරීම 2022 මාර්තු 31 දිනට පෙර සිදුකර අවසන් කල යුතුය. මෙහිදී දැනුවත් කිරීම පහසු කිරීම සඳහා මුද්‍රිත ලියවිල්ලක් ලබාදීමට අදහස් කරන්නේ නම්, ප්‍රජාමූල සංවිධාන නිළධාරීන්ගේ එකඟතාවය මත ප්‍රජාමූල සංවිධාන අරමුදලින් වැය දැරීමට අවසර ඇත.

මෙම වැඩසඉහන පැවත්වෙන අතර තුර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි බැංකු ණය වැඩසටහන පිළිබඳ අත්පත්‍රිකාවක් මුද්‍රණය කර බැංකු වෙත ලබාදීමට කටයුතු කර ඇත. එම පත්‍රිකාවන් ද සාමාජිකයන් අතට පත් කිරීමට කටයුතු කලයුතුය.

**06.** **දැනුවත් කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම.**

ඉහත උපදෙස් මත දැනුවත් කිරීම අදාල කාලසීමාව තුල නිම කර, බැංකු සමිති කළමනාකරු විසින් පහත ආකෘතිය අනුව ප්‍රගතිය දිස්ත්‍රික් සමෘද්ධි අංශයට 2022.04.08 දිනට පෙර ලබාදිය යුතු අතර, දිස්ත්‍රික් සමෘද්ධි අංශය 2022.04.22 දිනට පෙර microfinanceall2021@gmail.com විද්‍යුත් ලිපිනය හරහා එවිය යුතුය.

මේ පිළිබඳව සොයා බලා වාර්තා නියමිත දිනට ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලබාදීම දිස්ත්‍රික් බැංකු විෂය කළමනාකරු විසින් කල යුතුය.

දිස්ත්‍රික්කය : -.................................. ප්‍රා.ලේ.කොට්ඨාශය:- ............................

පිහිටුවා ඇති ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව :- ....................

| අනු අංකය | ප්‍රජාමූල සංවිධානයේ නම | දැනුවත් කිරීම පැවැත් වූ දිනය | සහභාගි වූ සාමාජිකයන් ගණන |
|---|---|---|---|
| | | | |
| | | | |

**07.** මෙම ප්‍රවර්ධන වැඩසටහන මගින් සමෘද්ධි බැංකු කටයුතු පිළිබඳ ප්‍රසිද්ධියක් ලැබෙන බැවින් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන දින බැංකු පරිශ්‍රය තුල සමෘද්ධි පතාක ප්‍රදර්ශනය කර වැඩසටහන පිළිබඳ ප්‍රජාවගේ ආකර්ශනය ලබාගැනීම ද සිදුකල යුතුය.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.- කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.